// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 1787/36 - 2012 දෙසැම්බර් මස 07 වැනි සිකුරාදා - 2012.12.07
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනත

1969 අංක 16 දරන පනතින්, 1981 අංක 21 දරන පනතින් 1993 අංක 22 දරන පනතින්, 1995 අංක 9 සහ 1996 අංක 20 දරන පනතින් සංශෝධිත ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 හා 156 වගන්ති යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ රෙගුලාසි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 නොවැම්බර් මස 14 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", 1200/6,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2012 ඉඩම් සංවර්ධන රෙගුලාසි යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ඉඩම් සංවර්ධන ආඥාපනතේ 162(1) වගන්තියේ දැක්වෙන පරිදි දීමනා පත්‍රයක් මත දුන් ඉඩමක් බැහැර කරවනු ලබන ලියවිලි මේ ආඥාපනතේ විධි විධාන වලට පටහැනිව සකසා ඇති අවස්ථාවක ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් එම ලේඛණ බල රහිත බවට කරනු ලබන ප්‍රකාශය පහත 'අ' ඇමුණුම පරිදි විය යුතු ය.

'අ' ඇමුණුම

ඉඩම් රෙජිස්ට්‍රාර්,

..................................................................,

පෙර ලියාපදිංචිය ...................................

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 42 හා 162(2) වන වගන්තිය යටතේ ප්‍රකාශිත ලේඛනය

........................................................................................ ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් ජනරාල් වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 3(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත I උපලේඛණයේ දැක්වෙන, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 37 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට බැඳෙමින් 19 (4) වගන්තිය යටතේ ප්‍රදාන පත්‍රයක් මත ලබාදුන් ඉඩමෙන්, පහත දැක්වෙන II උපලේඛණයේ දක්වා ඇති ඉඩම් සඳහා සකස් කරන ලද්දාවූ ලේඛනය ඉඩම් සංවර්ධන ආඥා පනතේ 162(1) වගන්ති යටතේ වූ විධිවිධාන උල්ලංඝනය වන පරිදි ලියා සහතික කරන ලද ලේඛනයක් බවට මා සෑහීමකට පත්වූ හෙයින්, ඉහත කී පනතේ 42 වන හා 162(1) වගන්ති යටතේ එකී II වන උපලේඛනය සඳහා ලියා සහතික කරන ලද ලේඛනය බල රහිත බවට ප්‍රකාශ කරමින් මෙම ලේඛනය ලියා සහතික කරමි.

I උපලේඛනය

II උපලේඛනය

දිනය :- .............................................

..............................................................

ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් ජනරාල්.

12 - 617

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.